# ශ්‍රී ලංකාවේ ස්වභාෂා අධ්‍යාපන විවාදයේ පැනනැගි මත පසුකාලීන ව්‍යාප්තිය ඔස්සේ සමාලෝචනය කිරීම

අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන නිබන්ධයකි.

70249

**ආර්. පී. ලියනගේ**

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ විද්‍යෝදය මණ්ඩපය
නුගේගොඩ.

## පෙර වදන

අධ්‍යාපනය දීම ඇරඹිය යුත්තේ මවුබසින්ය යන්න මනෝ විද්‍යාඥයන් අධ්‍යාපනඥයන්, හා භාෂා විශේෂඥයන්ද පිළිගත් සත්‍යයකි. පුද්ගලයකුට යමක යථා තත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබිය හැක්කේද සිය මවුබසින් බැවින් විශේෂයෙන් මව් බසින් දෙන අධ්‍යාපනය නිර්මාණාත්මක චින්තනයට යොමු කරවන්නක් බව අද සංවර්ධිත මෙන්ම සංවර්ධනය වන රටවල්ද පිළිගෙන ඒ සිද්ධාන්තය මත පිහිටා අධ්‍යාපනය දෙන බැව් පෙනේ.

එහෙත් යටත් විජිත වශයෙන් පැවති බොහෝ රටවල මෙන්ම ලංකාවේද විජිත පාලන සමයේ අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසිය වූ අතර මෙරට ස්වදේශිකයන්ගේ මාතෘ භාෂා වලට ලැබුණේ දෙවැනි තැනකි. මේ තත්වය මඟහරවා ගැනීමට විසිවන සියවසේ දෙවැනි කාර්තුව තුළ නොයෙකුත් ව්‍යාපාර මඟින් උද්ඝෝෂණ කෙරුණි. 1931 න් පසු මෙම උද්ඝෝෂණ වඩාත් පණ ගැන්වුන ද 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභා වාර්තාව (කන්නන්ගර වාර්තාව) 1947 දී නීතිගත වී ක්‍රියාත්මක වන තෙක් ප්‍රාථමික අධ්‍යාපනය වත් මව් බසින් දීම නීතිගත වූයේ නැත. එය ක්‍රියාත්මක වීමෙවුත් වසර කීපයක් ගතවන විටයි ද්විතීයික අධ්‍යාපනය මවු බසින් දීමේ යෝග්‍යතාව ගැන කථා කරන්නටවත් ඉඩක් සැලසුනේ. මේ කාලය තුළ මවු බසින් ඉගැන්වීම පිළිබඳ ආන්දෝලනයක් රටතුළ ඇතිවිය. ඒ ගැන පක්ෂව හා විපක්ෂව පුද්ගලයන් හා නොයෙකුත් සංවිධාන විසින් කරුණු දක්වන ලදී.

එවැනි පසුබිමක් යටතේ මවු බසින් ඉගැන්වීමට පක්ෂව හා විපක්ෂව එපල ඉදිරිපත් වූ විවිධ මත පසුගිය තිස් වසර තුළ ස්වභාෂා අධ්‍යාපන ව්‍යාප්තිය ඔස්සේ සමාලෝචනය කිරීම මෙම නිබන්ධනයේ තේමාවයි.

සමාලෝචනය තුළින් එදා ඉදිරිපත් වූ තර්ක කොතෙක් දුරට සත්‍ය වී හෝ අසත්‍ය වී ඇත් දැයි විමසමින් ස්වභාෂා අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා අනාගතයේ අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග යෝජනා කිරීම මෙහි නිර්මාණාත්මක අපේක්ෂණ යයි.

ස්වභාෂාවක් සංවර්ධනය වන විට ව්‍යාප්ත වීම විවිධ අංශයන් කරා සිදුවනු ඇත. බසක් වෙනුවට වෙනත් බසක් යොදා ගැනීමේදී ද හැම අංශයකට ම විවිධ ප්‍රමාණයන් ගෙන් එය ව්‍යාප්ත වනු ඇත. ස්වභාෂාව අඩුවෙන්ම යෙදුනු තැන්වලට යොදා- ගැන්ම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, මද වශයෙන් හෝ කලක් සිස්සේ භාවිත වූ අංශයන්හි තවදුරටත් ව්‍යාප්ත වෙමින්ද සිදුවන මේ ව්‍යාපාරය ප්‍රමාණානුකූලව විශ්ලේෂණය කිරීම අති දුෂ්කර කාර්යයකි. බස ව්‍යාප්ත වන්නේ ගඟක් දෙගොඩ තලා ගලන ආකාරයෙනි. එය ගලන විට වලවල් ඇති තැන්වලට වැඩි වතුර ප්‍රමාණයන් ද ගොඩැලි ඇති තැන්වලට අඩු වතුර ප්‍රමාණයන් ද විසුරුවමින් සම මට්ටමක් ඇති කරමින් පහතට ගලයි. ඉදිරියට බාධක මුණගැසෙන විට පහතට ගලන වේගය අඩු කොට දෙඅංශයට පිටාර ගලයි. විටෙක ඉදිරියේ වූ බාධකය කඩා බිඳ දමාගෙනද ගලයි. කෙසේ වුවද ක්‍රමික උපක්‍රමයකින් ගඟ වෙන අතකට නොහැරවුවහොත් පහතට ම ගලයි.

අපිරටේ ස්වභාෂා අධ්‍යාපනය පසුගිය දශක තුන තුළ ව්‍යාප්ත වූයේ ද මේ ආකාරයෙනි.

මම මෙහිදී එය පැතුරුණු අංශයන්ගෙන් බොහෝමයක් සංඛ්‍යා ලේඛනානුසාර- යෙන් දැක්වීමට සිය උත්සාහයක් දැරුවෙමි. ඉතා සුළු හා නොවැදගත් යයි සිතුනු අංශ අතහරින්නට ද සිදුවූයේ කෘතිය වඩාත් විශාල වනු වැළැක් වීමටය. කෙසේ වුවද ස්වභා- වක ව්‍යවහාරික ව්‍යාප්තියේ ප්‍රමාණය විස්තර කරන විට එය ප්‍රමාණ කරනු උගසට බැවින් සමහර අංශ අතහැරෙන්නට ද ඉඩ ඇතැයි පිළිගනිමි. ස්වභාෂා විවාදයේ ද බොහෝ වන ඇතුළත් කළත් නොවැදගත් යයි මට හැඟුනු නිසා අත හැරීමට සිදුවූ වකද ඇතැයි පිළි- ගනිමි.

සමාලෝචනයේ දී ඒ ඒ තැනදීම මා විමසන්නටත් වර්තමානය තුළින් ඒ වන සකාට වූ හා අකාට වූ ප්‍රමාණයන් විමසන්නටත් ගත් ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵල වශයෙන් අව- සානයේ කරන යෝජනා යතක් කළෙමි.

නීතියෙන් කෙසේවුවත් ප්‍රායෝගිකව ස්වභාෂා අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා වේ ව්‍යාප්තව නැත. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ද සියයට සියයක් ම කට- යුතු සඳහා එය තවම යොදාගන්නේ ද නැත. එම නිසා එයට ඇති දුෂ්කරතා වලට පිළියම් යොදමින් තවදුරටත් ප්‍රගතිය කරා යාමට මගේ සෙවීම හා වෑයම තුළින් මං පෙත් සලසා ගන්නට හැකි වනු ඇතැයි විශ්වාස කරමි. රජයේ මැදහත්වීමෙන් දුෂ්කරතා වලට පිළියම් යෙදෙමින් නව නවත් ස්වභාෂා මාධ්‍යය හැම අංශයකට ම ව්‍යාප්ත වනු දැකීම අපගේ ජාතික අපේක්ෂාවයි.

# ප ටු න

පිටු අංක

පෙර වදන

සූචිය

1 භාෂාවක උපත හා වැදගත්කම 1 – 15

2 මවුබස අර්ථ නිරූපණයක් 16 – 18

3 මවුබසින් අධ්‍යාපනය දීමේ ඇති වැදගත්කම 19 – 34

4 මවුබස අධ්‍යාපනයට යොදාගැන්ම–තුලනාත්මක විමසුමක් 35 – 44

5 ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාෂාව යොදාගැන්මේ ඉතිහාසය,

- පැරණි යුගයේ ස්වභාෂා අධ්‍යාපනය – 1830 තෙක් 44 – 58
- 20 වැනි සියවසේ මවුබස මාධ්‍යයේ ප්‍රගතිය 58 – 87
- රාජ්‍ය මණ්ඩල සභා යුගයේ ස්වභාෂා අධ්‍යාපනය හා විවිධ මත 88 – 109
- නිදහස් යුගයේ ස්වභාෂා අධ්‍යාපනය හා විවිධ මත 110 – 119
- 1956 න් පසු ස්වභාෂා අධ්‍යාපන ව්‍යාප්තිය හා විවිධ මත 120 – 138
- විද්‍යා අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය මවු බසින් දීම පිළිබඳ මත 139 – 158

6. 1960 – 70 දශකයේ ස්වභාෂා අධ්‍යාපන ව්‍යාප්තිය 159 – 184

7. සිංහලෙන් ඉගැන්වීමේ පාඨග්‍රන්ථවල විකාශනය 185 – 223

8. 1970 න් පසු ස්වභාෂා අධ්‍යාපන ව්‍යාප්තිය හා මංපෙත්: 224

- පාසල් ක්ෂේත්‍රය 225 – 234
- ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රය 235 – 239
- කාර්මික හා කෘෂිකාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය 240 – 245
- විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රය 246 – 255
- පරිපාලන ක්ෂේත්‍රය 256 – 271
- නීතිය හා අධිකරණය 272 – 276
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 277 – 279
- ශ්‍රී ලංකා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සේවා 280 – 282

• සිංහල විශ්ව කෝෂය 283 - 284

• සෝන්දයශී අධ්‍යාපනයේ ප්‍රගතිය 255 - 287

• ස්වභාෂා අධ්‍යාපනයේ ව්‍යාප්තිය හා සිංහල පාඨක ලෝකය 288 - 293

• " " " ප්‍රේක්ෂක ලෝකය සිනමාව 294 - 298

" " " " නාට්‍යය 299 - 300

• සාමාජික හා සංස්කෘතික මං පෙත් 301 - 310

9. දසවසක විභාග තොරතුරු 311 - 324

10 ස්වභාෂා අධ්‍යාපනය සහ සිටුවීමේලා අනාගතයේ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ 325 - 342

උපග්‍රන්ථය 1 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවල මුල් ග්‍රන්ථ 343 - 344

එම පරිවර්තන 345 - 354

මාර්ග පරිවර්තන 355 - 357

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කෝෂ ග්‍රන්ථ 358 - 360

" " පාඨග්‍රන්ථ 361 - 362

2 ශිෂ්‍යයන්, ගුරුවරුන්, උපාධි අපේක්ෂකයින් සහ උපාධිධාරී අභ්‍යාස ලාභීන් විසින් ලියවනු ලැබූ දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල ප්‍රතිශතක පංගුව 363

එම සතියකට කියවීම සඳහා ගත කරන පැය ගණන 364

3 මෙතෙක් පෙන්වා ඇති සිංහල චිත්‍ර පට අනු [illegible] පිළිවෙළින් 367 - 380

4 " " සිංහල නාට්‍ය 381 - 398


ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:


සිංහල 399 - 402

ඉංග්‍රීසි 405 - 406